ආර්ථික විද්‍යාව

4.6 නිෂ්පාදන සාධක වෙළෙඳපොළ හැසිරීම විස්තර කරයි.

ඉගෙනුම් පල

- සාධක ඉල්ලුම විග්‍රහ කරයි.
- සාධක සැපයුම විග්‍රහ කරයි.
- සාධක මිල තීරණය වන ආකාරය විග්‍රහ කරයි.
- නිෂ්පාදන සාධක ඉපැයුම විස්තර කරයි.
- සංක්‍රාම ඉපැයුම සහ ආර්ථික බදු කුලිය ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරෙන් පෙන්වයි.
- සංක්‍රාම ඉපැයුම හා ආර්ථික බදු කුලිය අතර වෙනස නිදසුන් සහිතව පැහැදිලි කරයි.

නිෂ්පාදන සාධක වෙළෙඳපොළ

භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය වැනි නිෂ්පාදන සාධක විකිණීමත්, මිලට ගැනීමත් සිදු කරන වෙළෙඳපොළ **සාධක වෙළඳපොළයි**. එනම් නිෂ්පාදන සාධක සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත සාධක මිලත්, සාධක සේවා නියුක්තියත් තීරණය කරන වෙළෙඳපොළ ලෙසද සාධක වෙළෙඳපොළ අර්ථවත් කළ හැකිය.

භාණ්ඩ වෙළෙඳපොළෙහි භාණ්ඩ වලට ඇති ඉල්ලුම හා සැපයුම මත භාණ්ඩවල මිල තීරණය වන්නා සේම සාධක වෙළෙඳපොළෙහි සාධක වලට ඇති ඉල්ලුම හා සැපයුම මත සාධක වල මිල තීරණය වේ.

අන්තගර්තය :ර්.එම්.එම්.එස්.ඩී.ගෝමස් මිය- ඩබ්.එම්.එම්.වීරසිංහ මිය- බප/ජය/ධමර්පාල විද්‍යාලය
යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය - වෙල්ස් කුමරි විද්‍යාලය
සැකසුම ලහිරු සී. ජයතිලක මයා - පො/හිඟුරක්දමන මහා විද්‍යාලය
අන්තගර්තය පරීක්ෂා කිරීම- ඩබ්ලිව්.ර්.එම්.ඩී. ලලිත් සමන්ත විජේසිංහ මයා- විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය- හොරණ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

සාධක ඉල්ලුම

සාධක සේවා විකිණීමට ඉදිරිපත් වන්නේ කුටුම්භ අංශයයි. සාධක සේවා ඉල්ලුම් කරන්නේ භාණ්ඩ හා සේවා නිපදවන ආයතනයි. ඒ අනුව සාධක වලට ඇති ඉල්ලුම රඳා පවතින්නේ එම සාධක භාවිත කොට නිපදවනු ලබන භාණ්ඩ වලට ඇති ඉල්ලුම මතයි.

සාධක භාවිත කරමින් සෘජු තෘප්තියක් ලැබෙන පාරිභෝගික භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීමේ හැකියාව හෙවත් සාධක ඵලදායිතාව මත සාධක ඉල්ලුම තීරණය වේ. එම නිසා නිෂ්පාදන සාධක සඳහා ඇත්තේ ව්‍යුත්පන්න ඉල්ලුමකි.

නිෂ්පාදන සාධක මිල මත සාධක ඉල්ලුම තීරණය කරන අතර සාධක මිල හා සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව පහත නිදසුන මගින් පැහැදිලි වේ.

ශ්‍රම ඉල්ලුම්කරු වන නිෂ්පාදකයා ශ්‍රමයේ මිල හෙවත් වැටුප මත ශ්‍රම ඉල්ලුම තීරණය කරයි.



නිෂ්පාදන සාධකය භාවිත කරමින් සෘජු තෘප්තියක් ලබා දෙන වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාවක් සාධක සතු වීම නිසා ඊට **ව්‍යුත්පන්න ඉල්ලුමක්** හටගන්නා බව පහත නිදසුන් මගින් පැහැදිලි කළ හැකියි.

උදා-ශ්‍රමයට ඇති ඉල්ලුම ජනිත වන්නේ එමගින් සෘජු තෘප්තියක් ලබාදෙන සහල්, ඇඟලුම් වැනි අවසාන භාණ්ඩ නිපදවා ගත හැකි බැවිනි.

- භූමියට ඇති ඉල්ලුම ජනිත වන්නේ එමගින් කෘෂි බෝග, ක්‍රීඩා පිටි, නිවාස වැනි සෘජු තෘප්තියක් ලබාදෙන දෑ නිපදවා ගත හැකි බැවිනි.

මේ අනුව නිෂ්පාදන සාධක මිල ගණන් හා සාධක ඵලදායීතාව මත සාධක ඉල්ලුම් කිරීමට නිෂ්පාදන ආයතන පෙළඹේ.

නිෂ්පාදන සාධක මිල සහ සාධක ඉල්ලුම් කරන ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාවය නිසා සාධක ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහලට බෑවුම් වේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

ඒ අනුව ශ්‍රම ඉල්ලුම් වක්‍රය පහත සඳහන් පරිදි වමේ සිට දකුණට පහලට බෑවුම් වේ.



සාධක සැපයුම

සාධක හිමි පුද්ගලයන් වන කුටුම්භයන්, තම සාධක නිෂ්පාදන ආයතනයන්ට අලෙවි කිරීම සාධක සැපයුමයි. සාධක හිමි පුද්ගලයන්ගේ සාධක ආදායම ඒ මත තීරණය වේ.

සාධක ඉල්ලුම හා සාධක සැපයුම මත තීරණය වන මිලට සාධක හිමි පුද්ගලයන් සාධකය සපයයි.

සාධක මිල වැඩිවන විට සාධක සැපයුම වැඩි වන අතර, සාධක මිල අඩු වන විට සාධක සැපයුම අඩු කරයි. එම නිසා සාධක මිල හා සාධක සැපයුම් කරන ප්‍රමාණ අතර අනුලෝම සම්බන්ධතාවයක් ඇත.

උදා:- ශ්‍රමයේ මිල හෙවත් වැටුප මත ශ්‍රම සැපයුම තීරණය වන්නේ මෙසේ ය.



මේ අනුව සාධක සඳහා වන සැපයුම් වක්‍රය වමේ සිට දකුණට ඉහළට බෑවුම් වේ.

Copyright © e-thaksalawa.moe.gov.lk



සාධක මිල තීරණය වන ආකාරය

සාධක සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත සාධක මිල තීරණය වේ. එසේ තීරණය වන මිල සංඥාවන්ට ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් දක්වන ප්‍රතිචාරය මත සමතුලිතය තීරණය වේ.

මේ අනුව සාධක ඉල්ලුම් වක්‍රයේ හා සාධක සැපයුම් වක්‍රයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය මත සාධක මිල හා සමතුලිත ප්‍රමාණය තීරණය වේ.

ශ්‍රම වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය තුළින් එය තවදුරටත් පැහැදිලි කළ හැක.



ඉහත රූප සටහන අනුව ශ්‍රම වෙළෙඳපොළ සමතුලිත අවස්ථාවේ A ලක්ෂයෙන් පෙන්නුම් කෙරේ. එම අවස්ථාවේදී ශ්‍රමයේ මිල හෙවත් සමතුලිත වැටුප් අනුපාතිකය W_1 වේ. සමතුලිත ශ්‍රම ප්‍රමාණය L_1 වේ.

ශ්‍රම වෙළෙඳපොළේ ශ්‍රම ඉල්ලුම හා සැපයුම් මත ශ්‍රමයේ මිල තීරණය වන්නා සේම අනෙකුත් සාධක වලද ඉල්ලුම හා සැපයුම මත ඒවායේ මිල ගණන් තීරණය වේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

ආර්ථික විද්‍යාව

සාධක ඉපැයීම

සාධක වෙළෙඳපොළ තුළ තීරණය වූ එක් එක් සාධක මිල ගණන් අනුව සාධක ඉපැයුම හෙවත් සාධක ආදායම තීරණය වේ. එය පහත පරිදිය.

- **භූමිය - බදු කුලිය**
- **ශ්‍රමය - වැටුප්**
- **ප්‍රාග්ධනය - පොළිය**
- **ව්‍යවසායකත්වය - ලාභය**

සාධක හිමි පුද්ගලයන්ගේ සාධක ආදායම තීරණය වන්නේ එක් එක් සාධකයේ සැපයුම් නම්‍යතාවය මතය.

උදා:-

භූමිය ඇතුළු ස්වභාවික සම්පත්වල සැපයුම අනම්‍ය නිසා භූමියට බදු කුලියක් උපයා ගැනීමේ හැකියාවක් ඇත.

එමනිසා අනම්‍ය සැපයුමක් ඇති ඕනෑම සාධකයකට බදු කුලියක් උපයා ගත හැකිවේ. ඒ අනුව සුවිශේෂී දක්ෂතාවන් හා හැකියාවන් උරුම කරගත් ඇතැම් වෘත්තීය ක්‍රීඩකයන්, ගායකයන්, නළු නිළියන් වැනි මානව සම්පත් වලට ද අනම්‍ය සැපයුමක් ඇති නිසා ඔවුන් විශාල ආදායමක් උපයා ගන්නා අතර එම ආදායමෙන් වැඩි කොටසක් ආර්ථික බදු කුලිය වේ.

ආර්ථික බදු කුලිය පිළිබඳ නූතන ප්‍රවේශය අනුව ස්වභාවික සම්පත් පමණක් නොව අනම්‍ය සැපයුමක් ඇති ඕනෑම සාධකයකට ද ආර්ථික බදු කුලිය උපයාගත හැකිවේ යැයි නිගමනය කළ හැකිය.

Copyright © e-thaksalawa.moe.gov.lk

ඒ අනුව කිසියම් සාධකයක් උපයාගන්නා ආදායම පහත සඳහන් සාධක ආදායම් දෙවගර්යෙන් සමන්විත වේ.



1.සංක්‍රාම ඉපයුම

කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තබා ගැනීම සඳහා, එම සාධකය අපේක්ෂා කරන අවමය එම සාධකයේ **සංක්‍රාම ඉපැයුමයි**. එනම් යම් සාධකයක් සේවා නියුක්ත කරවීම සඳහා ගෙවිය යුතු අවම මිල **සංක්‍රාම ඉපැයීමයි**. කිසියම් සාධකයකට එම අවමය වත් ලබා ගත නොහැකි නම් එම සාධකය තවදුරටත් එම කායර්යේ නිරත නොවී එම ඉපැයීම ලබාගත හැකි වෙනත් කායර්යක් සඳහා ඉවත්ව යයි.

එමනිසා එක් නිෂ්පාදන කායර්යක සිට තවත් නිෂ්පාදන කායර්යකට සම්පත් මාරු වීම වැළැක්වීම සඳහා සාධකයකට අවශ්‍ය අවම ඉපැයුම **සංක්‍රාම ඉපැයුමයි**. එමනිසා සාධකයක් පවත්නා භාවිතයේ රඳවා ගත හැක්කේ ආවස්ථික පිරිවැය පියවීමට ප්‍රමාණවත් ආදායමක් ලැබේ නම් පමණි. එම නිසා මෙම සංක්‍රාම ඉපැයුම, එම සාධකයේ ආවස්ථික පිරිවැය ලෙසටද හැඳින්විය හැක.



නිෂ්පාදන සාධකයක සැපයුම් වක්‍රය මගින් පෙන්නුම් කරන්නේ, එම ඒකකය සැපයීම සඳහා සැපයුම්කරුවා බලාපොරොත්තු වන අවම මිලයි. ඒ අනුව ඉහත රූප සටහනේ අඳුරු කළ කොටසින් එම සාධකයේ සංක්‍රාම ඉපැයුම දැක්වේ.

2.ආර්ථික බදු කුලිය

කිසියම් නිෂ්පාදනයක් සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තබා ගැනීමට අපේක්ෂා කරන අවම ගෙවීම ඉක්මවා උපයාගන්නා අතිරික්ත ආදායම **ආර්ථික බදු කුලියයි**. එනම් කිසියම් සාධකයක

Copyright © e-thaksalawa.moe.gov.lk

ආර්ථික විද්‍යාව

වර්තමාන ඉපැයුම සංක්‍රාම ගෙවීම ඉක්මවා යන්නේ නම් එම ඉක්මවා යන ප්‍රමාණය ආර්ථික බදු කුලියයි. එය පහත රූප සටහනෙන් දැක්විය හැක.



ඉහත රූප සටහනේ පරිදි OEP ත්‍රිකෝණය මගින් ආර්ථික බදු කුලිය පෙන්නුම් කළ හැකිය. මේ අනුව සාධක වල සමස්ත ඉපැයුම ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම යන සංරචක දෙකෙන් සමන්විත වන බව පහත රූප සටහනින් පෙන්නුම් කළ හැකිය.



මේ අනුව සාධක ඉපැයුම් තුළ සංක්‍රාම ඉපැයුම හා ආර්ථික බදු කුලිය යන දෙකම මිශ්‍රව පවතී. ඒ නිසා කිසියම් සාධකයක සමස්ත ඉපැයුම කුමක්ද යන්න තීරණය වන්නේ එම සාධකයේ සැපයුම් නම්‍යතාව මතය.

Copyright © e-thaksalawa.moe.gov.lk

සැපයුම් නම්‍යතාව අනුව සාධක වල සමස්ත ඉපැයුම තීරණය වන ආකාරය

සාධක සැපයුම් නම්‍යතාව විවිධ වන විට ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම්හි ද වෙනස්කම් ඇතිවේ.

පහත දැක්වෙන්නේ විවිධ සාධක සැපයුම් නම්‍යතා අවස්ථාවලදී ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම හැසිරෙන ආකාරයයි.

සාධක සැපයුම ඒකීය නම්‍ය වනවිට සාධක ඉපැයුම

සාධක සැපයුම ඒකීය නම්‍ය වන විට ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම් එකිනෙකට සමාන වේ.

පහත රූප සටහනෙන් දැක්වෙන්නේ එම තත්ත්වයි.



සාධක සැපයුම් පූර්ණ අනම්‍ය වනවිට සාධක ඉපයුම්

පූර්ණ අනම්‍ය සැපයුමක් ඇති සාධකයක සමස්ත ඉපැයීම ආර්ථික බදු කුලියෙන් පමණක් සමන්විත වේ.

පහත රූප සටහනින් පෙන්නුම් කෙරෙන්නේ එවැනි තත්ත්වයකි.

අන්තගර්තය :ඊ.එම්.එම්.එස්.ඩී.ගෝමස් මිය- ඩබ්.එම්.එම්.වීරසිංහ මිය- බප/ජය/ධමර්පාල විද්‍යාලය
යූ.කේ.ඩී.ආර්.පී. ජයසිංහ මිය - වෙල්ස් කුමරි විද්‍යාලය
සැකසුම ලහිරු සී. ජයතිලක මයා - පො/හිඟුරක්දමන මහා විද්‍යාලය
අන්තගර්තය පරික්ෂා කිරීම- ඩබ්ලිව්.ඊ.එම්.ඩී ලලිත් සමන්ත විජේසිංහ මයා- විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය- හොරණ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



ඉහත ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන පරිදි පූර්ණ අනම්‍ය සැපයුම් අවස්ථාවේදී සාධකයේ මිල ශුන්‍ය වුවද එම සාධකයේ සැපයුම් ප්‍රමාණය Q වේ.

සාධකයේ ඉපැයුම, මුළුමනින් ම ආර්ථික බදු කුලියක් වීමට හේතුව වන්නේ පූර්ණ අනම්‍ය සැපයුමක් ඇති අවස්ථාවේදී Q ප්‍රමාණයක් සේවා නියුක්ත කිරීම සඳහා ගෙවිය යුතු මිල ශුන්‍ය වීමයි. එනම් ශුන්‍ය මිලකදී වුවද Q ප්‍රමාණයක් සැපයීමට සාධක හිමියෝ කැමැත්තක් දක්වා ඇත.

සාධක සැපයුම පූර්ණ නම්‍ය වනවිට සාධක ඉපැයුම.

සාධක සැපයුම පූර්ණ නම්‍ය වන විට සමස්ත ඉපැයීම සංක්‍රාම ඉපැයුම් පමණක් වේ.
පහත රූප සටහනෙන් එම තත්ත්වය පෙන්නුම් කෙරේ.



සාධක සැපයුම පූර්ණ නම්‍ය වන විට P මිලට ඕනෑම සාධක ප්‍රමාණයක් සැපයීමට සාධක හිමියෝ කැමැත්තක් දක්වති.

සාධක සැපයුම අනම්‍ය වන විට සාධක ඉපැයුම

Copyright © e-thaksalawa.moe.gov.lk

සාධක සැපයුම අනම්‍ය වන විට සමස්ත ඉපැයුමෙන් වැඩි කොටසක් ආර්ථික බදු කුලියෙන් ද අඩු කොටසක් සංක්‍රම ඉපැයුමෙන් ද සමන්විත වේ.



අනම්‍ය සාධක සැපයුමක දී ආර්ථික බදු කුලිය, සංක්‍රාම ඉපැයුමට වඩා වැඩිවේ.

සාධක සැපයුම නම්‍ය වන විට සමස්ත ඉපැයුම

සාධක සැපයුම නම්‍ය වන විට වැඩි කොටසක් සංක්‍රාම ඉපැයුම් වන අතර අඩු කොටසක් ආර්ථික බදු කුලිය වේ.



මෙවැනි නම්‍ය සැපයුමක් ඇති සාධකයක සමස්ත ඉපැයුම තුල ආර්ථික බදු කුලියට වඩා වැඩි කොටසක් සංක්‍රාම ඉපැයුම වේ.

පහත උදාහරණය මගින් සමස්ත ඉපැයුම්, ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයීම් ගණනය කර දැක්විය හැක.

උදා:-

කිසියම් පුද්ගලයන් 30 දෙනකු වතර්මාන සේවා නියුක්තියෙන් දිනකට රු. 450.00 ක සමස්ත ඉපැයීමක් ලබාගනී. ඔවුන් වෙනත් රැකියාවක යෙදුණේ නම් ඔවුන්ට ලැබිය හැක්කේ දිනකට රු.300.00 ක සංක්‍රාම ඉපැයුමක් පමණි. එම අවස්ථාවේදී ඔවුන්ගේ ආර්ථික බදු කුලීය වන්නේ රු. 150 කි.

මේ තත්ත්වය පහත රූප සටහනට අදාල දත්ත මගින් ගණනය කර දැක්විය හැක.



සමස්ත ඉපැයුම = $15 \times 30 = 450$

සංක්‍රාම ඉපැයුම = $5 + 15 \times 30 \times \frac{1}{2}$

= $20 \times 30 \times \frac{1}{2}$

= 20×15

= <u>300</u>

ආර්ථික බදු කුලිය = $10 \times 30 \times \frac{1}{2}$

= <u>150</u>

Copyright © e-thaksalawa.moe.gov.lk